www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසප විපක්ෂ ජනාධිපති අපේක්ෂකයා අත්අඩංගුවට ගැනීම හෙලා දකියි

## Sri Lankan SEP condemns opposition candidate’s arest

සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශනය
2010 පෙබරවාරි 11

සමාජවාදී සමානතා පක්ෂය (සසප) පරාජිත ජනාධිපති අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකා අත්අඩංගුවට ගැනීම තරයේ හෙලා දකියි. මිලිටරි පොලිසිය මගින් පෙබරවාරි 08 දින ඔහු අත්අඩංගුවට ගැනීම වනාහි ජනාධිපති මහින්ද රාජපක්ෂ යටතේ පොලිස් මිලිටරි තන්ත්‍රයක් පැලපදියම් කිරීමේ පෙර සූදානමක කොටසක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කල මූලික ප්‍රහාරයකි.

ජනවාරි 26 දින පැවති ජනාධිපතිවරනයට තරඟ කිරීම සඳහා පසුගිය නොවැම්බර්යේ හමුදාවෙන් ඉවත්වූ ෆොන්සේකාට එරෙහිව කිසිදු චෝදනාවක් ගොනුකර නැත. රාජ්‍ය රහස් හෙලිදරව් කිරීම, ආන්ඩුව පෙරලීමට කුමන්ත්‍රනය කිරීම හා ජනාධිපතිගේ සහෝදරයන් ද ඇතුලුව රාජපක්ෂ හා ඔහුගේ සමීපතමයන් ඝාතනය කිරීමට සැලසුම් කිරීම වැනි ආන්ඩුවේ ප්‍රකාශකයන් විසින් විටින් විට ඉදිරිපත් කල විවිධාකාර චෝදනා, පරස්පර විරෝධයන්ගෙන් පිරී තිබේ.

මේ කුමන හෝ චෝදනාවක් සනාථ කරන සාක්ෂි කිසිවක් ඉදිරිපත්කොට නැත. ආන්ඩුවේ ප්‍රකාශයන්ට අනුව, සියලු චෝදනා ෆොන්සේකා තනතුරෙන් ඉවත්වීමට තෙමසකට පෙර නිලධාරියෙකු ලෙස සේවය කල අවධියේ ඔහුගේ කටයුතු වලට සම්බන්ධය. ආන්ඩුව ක්‍රියාත්මක වීමට මෙතරම් කලක් ගතකලේ මන්ද? පැහැදිලි පිලිතුර වන්නේ, ෆොන්සේකා විරුද්ධ පක්ෂයේ අපේක්ෂකයා බවට පත්වීමත් සමඟ ඔහු දේශපාලන කරලියෙන් ඉවත්කර තැබීමත්, සිය විරුද්ධවාදීන් බියගැන්වීමත් යන ක්ෂනික අරමුනු ඉටුකර ගැනීම සඳහා දැන් යොදාගනු ලබන චෝදනා, ආන්ඩුව විසින් ගොතා ඇත්තේය යන්නයි.

ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමෙන් යන්තම් පැය විසිහතරක් ඉක්ම යාමත් සමඟ රාජපක්ෂ. පාර්ලිමේන්තුව විසුරුවා හැර අප්‍රේල් 8 දින මහ මැතිවරනය නිවේදනය කලේය. බියගැන්වීම් හා ආන්ඩුවට එරෙහි කුමන හෝ දේශපාලන විරුද්ධත්වයක් මැඩීමේ තත්වයන් යටතේ මැතිවරනය පැවැත්වෙනු ඇත. ''ආන්ඩුව පෙරලා දැමීමේ'' කුමන්ත්‍රනයක් පිලිබඳ පැහැදිලි නොකල චෝදනා යටතේ මිලිටරිය විසින් ෆොන්සේකා ඉවතට ඇදගෙන යනු ලැබුවේ නම්, රාජපක්ෂ තන්ත්‍රයට අභියෝග කරන ඕනෑම අයෙකුට ද එවැනිම හෝ ඊටත් නරක පියවරයන්ට මුහුනපෑමට සිදුවිය හැකිය.

තම අරමුන, ව්‍යවස්ථාව වෙනස්කල හැකි පරිදි තුනෙන් දෙකක පාර්ලිමේන්තු බහුතරයක් ලබාගැනීම බව ආන්ඩුව ප්‍රකාශකොට තිබේ. රටතුල අඛන්ඩව පවත්වාගෙන යනු ලබන හදිසි නීතිය යටතේ විධායක ජනාධිපති ලෙස රාජපක්ෂ දැනටමත්, අසීමිත බලතල සියතට ගෙන තිබේ. සිය පලමු නිල කාලය තුල රාජපක්ෂ, පාර්ලිමේන්තුව රබර් මුද්‍රාවක තත්වයට පිරිහෙලා, රටේ අධිකරනය හා නීති පද්ධතිය තුට්ටුවකට නොසලකන දේශපාලන මිලිටරි කල්ලියක් මගින් පාලනය ගෙනයයි. දැන් රාජපක්ෂට අවශ්‍යව ඇත්තේ, තම පාලනයේ ආඥාදායක ක්‍රමෝපායන් නීතිගත කරන ව්‍යවස්ථාමය වෙනස්කම් සඳහා වරමක් ලබාගැනීමයි.

ෆොන්සේකා අත්අඩංගුවට ගැනීම පිලිබඳව මාධ්‍ය කෙරෙන් පලවන ප්‍රතිචාරය පෙන්නුම් කරන්නේ, පාලක කවයන් තුල කිසිවෙකුත් ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී නොසිටින බවයි. දක්ෂිනාංශික අයිලන්ඩ් පත්‍රය ප්‍රකාශ කලේ, අත්අඩංගුවට ගැනීම ''මවිතයට කාරනයක්'' නොවූ බවයි. ''දිගහැරෙමින් තිබෙන නාටකය'' තුල ''දඩයමක ලක්ෂන නැතුවා නොවේ'' යයි කතුවැකියෙන් පිලිගන්නා නමුදු එය චෝදනාව එල්ල කරන්නේ විරුද්ධ පක්ෂවලටය. ''ආන්ඩුව හා මිලිටරිය නීතියට අනුකූලව කටයුතු කරනු ඇතැයි බලපොරොත්තු වන'' බව එය සඳහන් කරයි.

වරින් වර ලිබරල්වාදී මවාපෑම්වල යෙදී සිටින ඩේලි මිරර් පත්‍රය, නරුමත්වයෙන් ඊට නොදෙවෙනි විය. එහි කතුවැකිය ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පිලිබඳ ප්‍රශ්නය නොසලකා හරිමින් ආන්ඩුවේ දේශපාලන ප්‍රමාද දෝෂය ගැන එයට දේශනා කිරීමට පමනක් උත්සුක

විය. ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමෙන් රාජපක්ෂ, ජෙනරාල්වරයා බිංදුවේ සිට වීරවරයෙකුගේ තත්වයට ඔසවා තිබෙන බව එය සඳහන් කරයි. එක පුවත්පතක් හෝ අත්අඩංගුවට ගැනීම හෙලාදැක්කේ වත් ආන්ඩුව විරුද්ධ පක්ෂයේ දේශපාලඥයන් මත කඩාපැනීම් නතර කල යුතු බව කියා සිටියේවත් නැත.

කොලඹ මාධ්‍ය, නිහඬ ජාත්‍යන්තර ප්‍රතිචාරයට සමගාමීව ක්‍රියාත්මක විය. ජනාධිපතිවරනයෙන් යන්තම් දෙසතියක් ගතවෙද්දී විපක්ෂයේ ප්‍රධාන අපේක්ෂකයා හිතු මනාපයේ අත්අඩංගුවට ගැනීම ගැන එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව සඳහන් කලේ ''අසාමාන්‍ය'' දෙයක් යනුවෙනි. මෙම ප්‍රකාශය, ඉරාන ජනාධිපතිවරනය දූෂිත යයි හංවඩු ගසමින් හා ඉරාන පාලන තන්ත්‍රය සිය විරුද්ධවාදීන් මර්ධනය කරන්නේ යයි චෝදනා කරමින් පසුගිය වසරේදී එක්සත් ජනපදය හා එහි සගයන් දියත් කල දැවැන්ත ව්‍යාපාරයෙන් කැපී පෙනෙන වෙනසක් සලකුනු කරයි. ඉරානය හා ලංකාව සම්බන්ධයෙන් ගත් කල පලවූ හා නොපලවූ ප්‍රතිචාරය තීරනය කරනුයේ, එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ආසක්තයන්ට අනුකූල වන පරිදි මිස ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පිලිබඳව ඔවුන්ට ඇති කනස්සල්ලක් නිසා නම් නොවේ.

වහාම හා කොන්දේසි විරහිතව ෆොන්සේකා නිදහස් කල යුතු යයි සසප කියා සිටියි. කෙසේ වෙතත් එසේ කිරීමේදී අපි, ෆොන්සේකා කෙරෙහි හෝ ඔහුට සහයෝගය දැක්වූ විරුද්ධ පක්ෂ කෙරෙහි කිසිදු විශ්වාසයක් නොතබන ලෙසට කම්කරු පන්තියට අනතුරු අඟවන්නෙමු. පසුගිය මැයි මාසයේ එල්ටීටීඊ පරාජයට පත්කරන තෙක් ෆොන්සේකා රාජපක්ෂ කල්ලියේ හවුල්කරුවෙකුවූ අතර, ජනාධිපති 2006 වසරේදී යලි ආරම්භ කල යුද්ධය නිර්ධය ලෙස ඉදිරියට ගෙන ගියේය. ආන්ඩු ගැති ඝාතක කල්ලිවල ක්‍රියාකාරිත්වය ද ඇතුලු ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අමු අමුවේ උල්ලංඝනය කිරීම හා යුද අපරාධ පිලිබඳව මේ පුද්ගලයන් දෙදෙනාම වගකීමෙන් බැඳී සිටියි.

එසේම, එක්සත් ජාතික පක්ෂය (එජාප) හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යන විපක්ෂයේ ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙකටම ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කිරීම පිලිබඳව ඇත්තේ දිගු ඉතිහාසයකි. ''ප්‍රජාතන්ත්‍රවාදීන්'' ලෙස වෙස්ගැනීමේ ලා ඔවුන් සතු හැකියාව රඳාපවත්නේ, අවිචේචනාත්මකව ෆොන්සේකා නිදහස්කර ගැනීමේ විරුද්ධ පක්ෂ ව්‍යාපාරයට රිංගාගත් නව සමසමාජ (නසසප) හා එක්සත් සමාජවාදී පක්ෂයේ (යූඑස්පී) හිටපු වම්මුන්ගේ සහයෝගය මතය.

සසප මෑතකදී කල අනතුරු ඇඟවීම් මෙම අවස්ථාවාදීන්ගේ කටයුතු වලින් සනාථ වී තිබේ. (''සසප එක්සත් සමාජවාදී පක්ෂයට පිලිතුරු දෙයි'' යන ලිපිය ද කියවන්න)

තමන්ගේම පන්ති අවශ්‍යතාවන් වෙනුවෙන් කම්කරු පන්තිය අරගලයට පිවිසීමට පටන්ගන්නා විට, සිය පන්ති පාලනය අනතුරට ලක් කරන දේශපාලන විභේදනයන් පාලක පන්තිය තුල මතුවෙමින් තිබේ. කෙසේ වෙතත්, කම්කරුවන් හා තරුනයන් ස්වාධීනව බලමුලු ගැන්වීම කෙසේ වෙතත් නසසප හා යූඑස්පී, සිතාමතාම එවන් වර්ධනයක් ලොප්කර දැමීම සඳහා ෆොන්සේකා හා දක්ෂිනාංශික විරුද්ධ පක්ෂ පිලිබඳව අන්තරායකාරී මිත්‍යාවන් වගාකරමින් සිටියි.

ලංකාවේ ධනේශ්වරය මුහුනපා සිටින ගැඹුරු දේශපාලන අර්බුදය මඟින් නසසප හා යූඑස්පී වැඩකටයුතුවල වැදගත්කම සනිටුහන් කරයි. පාලක කවයන් තුල නිර්මිතව තිබෙන දේශපාලන කලි කලහයන් වනාහි, එන්ට එන්ටම නරක අතට හැරෙන රටේ ආර්ථික තත්වය මඟින් උත්පාදනය කල ආන්තික සමාජ ආතතීන්ගේ නිමැවුමකි. ආඥාදායක පාලන ආකෘතීන් සඳහා රාජපක්ෂගේ සූදානම මූලික වශයෙන් එල්ලකෙරී ඇත්තේ ෆොන්සේකාට හා විරුද්ධ පක්ෂවලට නොව කම්කරු පන්තියට එරෙහිවය. රට තුල පෙන්නුම් කෙරෙන්නේ විශේෂයෙන්ම වර්තමානයේ ලෝකය පුරාම මතුවෙමින් තිබෙන නය අර්බුදයක තීව්ර රූපාකාරයකි. සිය යුද පිරිවැය පියවා ගැනීම සඳහා රටම උකසට තබා ඇති රාජපක්ෂට දැන් බලකෙරී ඇත්තේ, පොදු වියදම් කපා හැරීමටත්, වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන් මත මූලික ප්‍රහාරයක් දියත් කිරීමටත් ය.

රාජපක්ෂ හා ෆොන්සේකාගේ කන්ඩායම් අතර හටගන්නා ගැටුම්වල සියලු කර්කෂභාවයන් මධ්‍යයේම වුවත්, ඔවුන් අතර ඇත්තේ මුලුමනින්ම උපායික ස්වභාවයක් ගන්නා වෙනස්කම්ය. එනම් කම්කරු පන්තියට මුහුන දෙන්නේ කෙසේ ද හා ප්‍රධාන බලවතුන් අතර, විශේෂයෙන්ම එක්සත් ජනපදය හා චීනය අතර, උග්‍රවන එදිරිවාදිකම් තුල තමන් පෙලගැසිය යුත්තේ කොතැනක ද යන ප්‍රශ්න ය. සිය අයිතීන් රැකගැනීම සඳහා වන කම්කරුවන්ගේ ඒකාබද්ධ ව්‍යාපාරයකට මුහුන දුන් කල කඳවුරු දෙකම, තම විරසකයන් ඉක්මනින්ම ඉවත දමා විරුද්ධත්වය කුඩුපට්ටම් කර ලාභ පද්ධතිය ආරක්ෂාකර ගැනීමට වඩාත් රුදුරු ක්‍රමෝපායන් යොදාගැනීමට පසුබට නොවනු ඇත.

කම්කරු පන්තිය බරපතල අන්තරායන්ට මුහුනපා සිටියි. ධනේශ්වරයේ එක් හෝ තවත් කන්ඩායමකට දේශපාලනිකව බැඳී සිටින තාක් කල් කම්කරුවන්ට, සිය පන්ති අවශ්‍යතාවන් ආරක්ෂාකර ගත නොහැකිවනු ඇත. ඒ වෙනුවට ඔවුන් පන්ති අරගලයේ ක්‍රමවේදයන් යොදා ගනිමින් ස්වාධීන මාවතක් සකසා ගත යුතුය.

මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා ජීවන තත්වයන් ආරක්ෂාකර ගැනීමේ පලමු පියවර වශයෙන් කම්කරු පන්තික ප්‍රදේශ වල ද සේවාස්ථාන වල ද ස්වාධීන ක්‍රියාකාරී කමිටු වහාම ගොඩනඟාගත යුතු බව සසප අවධාරනය කරයි.

ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සඳහා අරගලය, ධනවතුන් ස්වල්ප දෙනෙකු විසින් ඉමහත් බහුතරයක් ආර්ථික වශයෙන් සූරාකෑම තුල මුල් විහිදුවාගත් සමාජ පර්යායක් වන ධනවාදයට එරෙහි අරගලය සමඟ, නොවෙන්කල හැකි පරිද්දෙන් බැඳී තිබේ. පාලක පන්තියේ සියලු කොටස්වලට එරෙහිව කම්කරු පන්තිය, කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා සටන් වැදිය යුතුය. එමගින්, වැඩකරන ජනතාවගේ සමාජ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා, සමාජය ඉහල සිට පහලටම ප්‍රති සංවිධානය කරන සමාජවාදී ප්‍රතිපත්ති ඇතුලත් ක්‍රියාමාර්ගයක් පනගැන්විය යුතුය.

එවන් දේශපාලන අරගලයක් සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසිය වන්නේ සිංහල කම්කරුවන් දෙමල කම්කරුවන්ගෙන් ද ශ්‍රී ලංකාවේ කම්කරුවන් දකුනු ආසියාවේ ද ජාත්‍යන්තරව ද පැතිරී සිටින සිය පන්ති සහෝදරයන් හා සහෝදරියන් ගෙන් බෙදා වෙන් කිරීම සඳහා දශක ගනනාවක් තිස්සේ උපයෝගීකරගෙන තිබෙන ජාතිවාදයේ ද වර්ගවාදයේ ද සියලු රූපාකාරයන් ප්‍රතික්ෂේප කිරීමය. වැඩකරන ජනතාව මුහුනදෙන ගැටලුවලට මෙම දිවයිනේ පටු සීමාවන් තුල කිසිදු විසඳුමක් ඇත්තේ නැත. ශ්‍රී ලංකා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටන කලාපයන් පුරා ද ගෝලීය පරිමානයෙන් ද සමාජවාදය සඳහා වන පුලුල් අරගලය සමඟ අවියෝජනීය ලෙස බැඳී තිබේ.

සමාජවාදී සමානතා පක්ෂය සියලු කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටින්නේ, මෙම දේශපාලන ප්‍රශ්න වලට වහාම අවධානය යොමුකරන ලෙසත් පක්ෂය අමතන ලෙස හා එහි දේශපාලන ව්‍යාපාරයට ක්‍රියාකාරීව සම්බන්ධ වන ලෙසත් ය.

© www.wsws.org